**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

පහත දැක්වෙන උසස් ගිණුම්කරණ පරිචයන් වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) සංස්ථාව සතු රු. මිලියන 5.72 ක් වටිනාකම වූ අමතර කොටස්, ට්‍රැක්ටර් 03 ක් හා ට්‍රේලර් 03 ක් සහ මෝටර් සයිකල් 04 ක් පුත්තලම හොල්සිම් පුද්ගලික සමාගම භාරයේ ඇති අතර මේවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) (i) සංස්ථාව සතු පුත්තලම පලාවිහි ඇති අක්කර 180, රූඩ් 05, පර්චස් 48 ක ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ii) ප්‍රයෝජනයට ගනු ලබන, රු. 8,475,665 ක් වූ වත්කම් වර්ග 6 ක් ක්ෂය කර වටිනාකම ශූන්‍ය වී ඇතත් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින් 62.45% ක් සංස්ථාව සතු වුවද, ඒ සඳහා ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර නොතිබුණි.

1.2.2. ගිණුම්කරණ අඩුපාඩු

රු. 4,413,656 ක් වූ මෝටර් රථ හා රු. 29,911 ක් වූ ආයුධ හා ජංගම උපකරණ සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය කර නොතිබුණි.

1.2.3 නොසැසඳු පාලන ගිණුම්

ලෙජරය හා ශේෂ පිරික්සුම පරීක්ෂාවේදී ගිණුම් ශේෂ 6 ක පැවති එකතුන් අතර රු. 5,260,843 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ණයගැති හා තැන්පත් ශේෂ වල වටිනාකම රු. 119,073,840 ක් වූ අතර, ඉදිරිපත් කර ඇති කාල විශ්ලේෂණය අනුව ප්‍රධාන කාර්යාලයේ වර්ෂ 2 සිට 5 අතර ශේෂ රු. 14,947,649 ක් ද, වර්ෂ 5 ඉක්මවා තිබූ ශේෂ වටිනාකම රු. 6,705,834 ක් ද, විය. යාපනය කාර්යාලයේ වර්ෂ 05 ඉක්මවූ ණයගැති ශේෂ රු. 676,706 ක් විය.

(ආ) ණයහිමි හා උපචිත වියදම් මුළු වටිනාකම රු. 61,729,566 ක ශේෂ වලින් යාපනය කාර්යාලයට අදාල වර්ෂ 2 සිට 5 අතර ණයහිමි ශේෂ රු. 61,500 ක් ද, වර්ෂ 05 ඉක්මවූ ණයහිමි ශේෂ රු. 31,929 ක් ද, වූ අතර ප්‍රධාන කාර්යාලයේ වර්ෂ 2 සිට 5 අතර ණයහිමි ශේෂ රු. 4,987,536 ක් ද, වර්ෂ 5 ඉක්මවූ ණයහිමි ශේෂ රු. 5,790,690 ක් ද, විය.

1.2.5 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තිරණ වලට අනුකුල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකුල නොවීම් අවසථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තිරණ වලට යොමුව | අනුකුල නොවීම් |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය . | සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායක මුදල් අයකිරීම ඊලඟ මාසයෙ අන්තිම දිනට පෙර යැවිය යුතු වුවත් නියමිත දිනට යැවීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩ නැගීමේ බදු පනතේ 2 වගන්තිය | දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කල යුතු රු. 717,675ක් වු ජාතිය ගොඩ නැගීමේ බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනතේ 2.1 වගන්තිය | දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු රු. 10,042,208ක් වු එකතු කළ අගය මත බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඈ) | 1990 අංක 6 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ 3 වගන්තිය | පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කල යුතු රු. 9,279,249ක් වු ව්‍යාපාර පිරුවැටුම් බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඉ) | 2009 සැප්තැම්බර් 01 දිනැති අංක ඩීඑම්ඒ/2009(2) දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු.543,939,109 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලයෙ රු. 5,074,586 ක අතිරික්තයක් පෙන්නුම් කෙරුණු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු. 79,373,422 ක් වූයෙන් පසුගිය වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ රු. 84,448,008 ක ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට හේතු වී තිබුනේ විකුණුම් පිරිවැය අඩු වී තිබීම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් පසුගිය වසරට වඩා රු. 6,222,311 කින් වැඩිවීමත් ය.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කම්හල් හා ආයතන පැවරීම් හා ඒවායේ වර්තමාන තත්ත්වය

සිමෙන්ති සංස්ථාව යටතේ පැවති කම්හල් හා ආයතන පැවරීම් හා ඒවායේ වර්තමාන තත්ත්වය පහත දැක්වේ.

| පැවරීමට අදාල අධිකාරිය | කම්හල/ ආයතනය | පැවරූ දිනය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| | රුහුණු සිමෙන්ති කම්හල | 1992 | පුද්ගලික පාර්ශවයකට විකුණා ඇත |
| 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් ව්‍යාපාරික ආයතන ප්‍රසිද්ධ සමාගම් බවට පරිවර්ථනය කිරීමේ පනතේ 2(2)(ii) වගන්තිය | පුත්තලම සිමෙන්ති කම්හල | 1993 මැයි 11 | සීමාසහිත පුතතලම සමාගම නමින් ස්ථාපනය කර ඇත. |
| | මට්ටක්කුලිය කඩදාසි මළු කම්හල | 1993 අගෝස්තු 15 | කලම්බු සැක් මේකර්ස් ලිමිටඩ් නමින් ස්ථාපනය කර ඇත. |
| උතුරේ පැවතුන යුධමය තත්ත්වය | කන්කේසන් සිමෙන්ති කම්හල | 1990 | වසා දැමීම |
| | සීමාසහිත පුත්තලම සමාගම | 1995 | හොල්සිම් පුද්ගලික සමාගම පිහිටුවීම |
| | අක්කර 5352 වූ හුණුගල් නිධිය | 1995 | හොල්සිම් සමාගමට වසර 50 කට බදු දී තිබුණි. |

### 2.2.2 කාර්ය සාධනය

සිමෙන්ති මෙට්‍රික් ටොන් 71,120 ක් අලෙවි කිරීමට ඉලක්ක කර තිබූ අතර, මෙට්‍රික් ටොන් 36,260 ක් අලෙවි කර තිබූණි. මෙය අයවැය ගත ඉලක්කයෙන් 51% ක් විය.

### 2.2.3 කළමණාකරන අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුත්තලම පාලවිහි කල්ලඩිවල ඇති සංස්ථාව සතු අක්කර 180ක ඉඩම කිසිම ප්‍රයෝජනයකට නොගෙන අනාරක්ෂිතව පවතින අතර එහි අනවසරයෙන් මිනිසුන් පදිංචි වී තිබුණි.

(ආ) වරායෙන් සිමෙන්ති තොග නිදහස් කර ගැනීමට ප්‍රමාද වීම මත රු. 414,425 ක මුදලක් වරාය හා නැව් සමාගම් වෙත ප්‍රමාද ගාස්තු ලෙස ගෙවීමට සිදුවී තිබුණි.

2.2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාව රු. 1,083,618,910 ක මුදලක් සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ ආයෝජනය කර තිබුණු අතර, 1981 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම සංස්ථාවට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ආ) පෞද්ගලික සමාගමක 1990 වර්ෂයේ දී ආයෝජනය කර ඇති රු. 4,800,000 ක මුදල සඳහා කිසිදු ප්‍රතලාභයක් ලැබී නොතිබුණු අතර එම කොටස් වලට හිමි ලාභාංශ වෙනුවට කතරගම නිවාස ව්‍යාපෘතියක් ඉදිකල යුතු බවට කොන්දේසි සහිතව රු.6,000,000 ක චෙක්පතක් 2010 වර්ෂය තුල සංස්ථාවට ලබාදී තිබුණද එම ව්‍යාපෘතියෙන් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සිමෙන්ත බෑග් 725,200 ක් ආනයනය කර තිබූ අතර, සිමෙන්ති බෑග් 640 ක ඌණතාවයක් සිදුවී තිබුණි. බෑග් 13,803 ක් පළුදු වී තිබූ අතර, බෑග් 955 ක් ගල්වී තිබුණි. මෙම වියදම් අවම කර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

2.2.5 හඳුනා ගත් පාඩු

කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණයක් නොකිරීම හේතු කොට ගෙන අයිරා පොලී ලෙස එකතුව රු.7,281,783 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

2.2.6 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම

2003 ජුනි 02 දින හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ජේදය ප්‍රාකාර සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.2.7 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත ආදායම්, වියදම් සහ තත්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ණයගැති හා ණයහිමි පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) අයවැය පාලනය

(ඈ) ඉන්වෙන්ට්‍රි ලේඛන පැවැත්වීම

(ඉ) වත්කම් ප්‍රත්‍යාගණනය.

(ඊ) මූල්‍ය කළමනාකරණය